# බලංගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

## නර්තනය - 7 ශ්‍රේණිය

### විවිධ කලාංගවල සෞන්දර්යාත්මක වටිනාකම

# කතරගම දේවාල පෙරහැර

## පෙරහැර පැවැත්වීමේ අරමුණු

- ❖ බැතිමතුන්ගේ අපල උපද්‍රව දුරු කිරීම
- ❖ දේවාශිර්වාදය ලැබීම හා රටට සෙත් පැතීම
- ❖ වර්ෂාව හා  සශ්‍රීකත්වය ලබා ගැනීම
- ❖ ස්වභාවික විපත්වලින් රට බේරා ගැනීම

## පෙරහැර පැවැත්වෙන කාලය

කප් සිටුවීමෙන් දින 44ක් ගෙවුණු තැන දී එළඹෙන අමාවක ගෙවී, පුර පැළවිය දිනයේ පුස නැකතින් කතරගම දේවාලයේ පෙරහර ආරම්භ වේ. **ඇසළ මාසයේ** මංගල්‍යය පැවැත්වෙන මුළු කාලය තුළම කතරගම දෙවියන් මිනිස් ලොවට පැමිණ සිටුවන ලද කපෙහි වාසය කරන බවට විශ්වාසයක් පවතී. ඒ නිසා සිටවන ලද කප පූජා වස්තුවක් ලෙස සලකනු ලැබේ. මෙය පෙරහරේ ප්‍රථම වාරිත්‍රයයි.


## කතරගම පෙරහැර හා බැදි චාරිත්‍ර

කතරගම දේවාලයේ සාම්ප්‍රදායික වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගල්‍ය උත්සව තුනකි.

1. අවුරුදු මංගල්‍යය
2. ඇසළ උත්සවය
3. ඉල් මහ මංගල්යය

**ගිනි පෑගීම, බිම පෙරළීම, කටු ගැසීම** ආදී දුෂ්කර කාර්යයන් හි නියැළෙන්නේ දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහාය.








මගුල් පෙරහැර පැවැත්වෙන දිනයන් හි දී විශේෂ කැවුම්, කිරිබත් සකස් කිරීම චාරිත්‍රයක් වශයෙන් සිදුවන්නකි. කැවිලි සකස් කරනුයේ දේවාලයේ තේවාකරුවන් වන **ගම්පහ විධානේය.** පෙරහැර පටන් ගැනීමේදී **‘වත බැදීම’** නම් චාරිත්‍රයක් වේ. වත බැදීම යනු දේවාභරණ ගෙනයන ඇතුපිට වස්ත්‍ර ඇතිරීමයි.

## ගායන හා වාදන අවස්ථා

ඇසළ පුර පසළොස්වක ගෙවී අවපැලවිය ලබන දිනයේ දී **'වේගවත් පෙරහැර'** නමින් හැඳින්වෙන විශේෂ පෙරහැරක් පැවැත්වේ. දුවන පෙරහැර යනු මෙයට තවත් නමකි. මෙම පෙරහැර මහා දේවාලයෙන් නික්ම වල්ලිඅම්මා දේවාලය වෙත යයි. මෙහි දී විශේෂ හේවිසි වාදනය දැකිය හැකිය. නිලධාරීන් ඉදිරියේ පැවැත්වෙන හේවිසි වාදනයේදී වාදනය කරනු ලබන්නේ එම අවස්ථාවට පමණක් සැකසුණු බෙර පදයකි. මෙම බෙර පදය නම් කර ඇත්තේ **'වීරපදය'** නමිනි.



හේවිසි වාදනය මෙන්ම **දමිළ බෙරය( තවිල් බෙරය), නාගස්වරම්** ආදී භාණ්ඩ වාදනය කිරීම මෙම පෙරහරේ දැකිය හැකිය. ඊට අමතරව දේශීය වාද්‍ය භාණ්ඩ ද භාවිතා කෙරේ.

දෙවියන් වැඩම කිරීම සිදුකරන්නේ මහා දේවාලයෙන් ලබාගත් පිරිත් පැන් දේවාලය පුරා ඉසීමෙන් හා දේවාලය තුළ තැන්පත් කිරීමෙන් අනතුරුවය එහිදී **'හරෝ හරා'** නාදයෙනුත් තූර්යවාදන, සන්ධ්‍යා හා සීනු නාදයෙනුත් අවට පරිසරය ගිගුම් දෙයි පෙරහැර එළිය කරන පන්දම්කරුවන් ද සුවඳ දිය හා මල් ඉසින්නන්ද මාර්ගය පවිත්‍ර කිරීම පිණිස කහදියර ඉසින්නන්ද  ස්තෝත්‍ර හා ද්‍රවිඩ ගීතිකා ගායනා කරන්නන් ද පෙරහැර දෙපසින් ගමන් කරනු දැකිය හැකිය.

මෙහිදී සිංහල හා ද්‍රවිඩ ජනතාවගේ එකමුතුකම ද පෙනේ. මෙහිදී දිස්වන්නේ රජ පෙරහරක ස්වරූපයකි. ඊට හේතුව රජ පෙරහැරක ඇතුළත් වූ සෑම අංගයක්ම මෙම පෙරහරේ අන්තර්ගතව තිබීම යි.

## සැරසිලි හා රංග වස්ත්‍ර

පෙරහැරේ වැඩම කරවනු ලබන ශුද්ධ වස්තු යන්ත්‍ර හා දේව රූප වාසනාමේදිය වෙත ගෙන යනුයේ කපුරාලය. දේවාලයේ සිට මේදිය තෙක් ඌව මාර්ගය රතු පලසක් වැනි පාවඩයකින් හා සුදු වියනකින්  සරසයි.
අලි ඇතුන්ගෙන් මෙන්ම විදුලි බුබුළුවලින් හා වීදි සැරසිලි වලින් පෙරහැර අලංකාර වෙයි.



## පෙරහැරේ ගමන් කරන අංග

1. ඉර හඳ නිරූපණය කරන සිංහල ඡත්‍ර (කොඩි),සේසත් දරන්නන්



2. දිසා කොඩි දරන්නන්

3. බස්නායක නිලමේ හා දේවාලයේ ලේකම්වරයා



4. දෙවියන් වැඩම වන ඇතු පිට ගමන් කරන ප්‍රධාන කපුරාල( මොහු මුඛවාඩමින් සැරසී සිටියි)

5. ඇතු පිටුපස ගමන් කරන ආලත්ති අම්මලා





6. උඩරට පහතරට හා සබරගමු ආදී සාම්ප්‍රදායික නර්තන අංග



7. කුළු, ගොයම්, රබන්, සවරන්, චාමර, වේවැල්, තාලම්, ලී කඩු ආදී විවිධ ගැමි නැටුම්



8. සිංහ නැටුම, හනුමන්තා නැටුම, මොණර නැටුම ආදී නිර්මාණ නැටුම්.





9. කාවඩි, කොහොඹ කළය, කතරගම් ආදී ද්‍රවිඩ ජන නැටුම්





10. හේවිසි වාදන කණ්ඩායම්, තූර්ය වාදන කණ්ඩායම්

සාම්ප්‍රධායික බෙර වාදන ඇඳුම් කට්ටල හා සාම්ප්‍රදායික නර්තන ඇඳුම් කට්ටල ද භාවිතා කර අතර විවිධ අයුරින් නිර්මාණය කරන ලද රංග වස්ත්‍රාභරණ ද මෙම නැටුම සඳහා භාවිතා කරනු ලැබේ.
ගායනය වාදනය නර්තනය සඳහා ස්ත්‍රී පුරුෂ දෙපිරිසම සහභාගි වෙති
පෙරහැර අවසාන වනුයේ **දිය කැපීමේ** චාරිත්‍රයෙනි.





## කාර්ය පත්‍රිකාව

| පැවැත්වීමට හේතු | පැවැත්වෙන කාලසීමාව |
|---|---|
| 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... | 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... |
| පෙරහැරේ දක්නට ලැබෙන නර්තන අංග | පෙරහැරේ දක්නට ලැබෙන වාදන භාණ්ඩ |
| 1. ......................................................<br>2. ......................................................<br>3. ......................................................<br>4. ......................................................<br>5. ...................................................... | 1. ......................................................<br>2. ......................................................<br>3. ......................................................<br>4. ......................................................<br>5. ...................................................... |
| පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ පුද්ගල නාම | පෙරහැර හා සම්බන්ධ සුවිශේෂ චාරිත්‍ර විධි |
| 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... | 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... |
| පෙරහැරේ දක්නට ලැබෙන සැරසිලි අංග | භක්තිය දැනවීම සඳහා කරන කාර්යය |
| 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... | 1. ......................................................<br>2. ......................................................<br>3. ...................................................... |
| ද්‍රවිඩ සංස්කෘතිය හා බැදි නර්තනාංග | ද්‍රවිඩ සංස්කෘතිය හා බැදි වාද්‍ය භාණ්ඩ |
| 1. ......................................................<br>2. ...................................................... | 1. ......................................................<br>2. ...................................................... |

සැකසුම - දිනූෂා ශ්‍යාමලී
ර / ශ්‍රී නාරද මහ විද්‍යාලය
බලංගොඩ